AL/2016/57/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ..................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

උපදෙස්:

※ I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ II කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** පහත දැක්වෙනුයේ විවිධ වර්ගීකරණවලට අයත් කලා පිළිබඳ ගොනු කිහිපයකි. ඒ අතුරෙන් ප්‍රාසංගික කලා තුනක් අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) නාට්‍ය කලාව, චිත්‍ර කලාව, සිනමා කලාව
(2) මුද්‍රා නාට්‍ය, බැලේ, සිනමා කලාව
(3) බැලේ, ඔපෙරා, සංගීතය
(4) නර්තනය, නාට්‍ය කලාව, චිත්‍ර කලාව
(5) සංගීතය, ඔපෙරා, මූර්ති කලාව (.........)

**2.** ප්‍රාසංගික කලාවක් සම්පූර්ණ වීමට අත්‍යවශ්‍ය සාධක අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) නිළිය, රූපණය, වේදිකාව
(2) වේෂභූෂණ, වේදිකාව, අභිවාහකයා
(3) රංගභූමිය, ආලෝකය, නළුවා
(4) අභිවාහිකයා, ප්‍රේක්ෂකයා, අධ්‍යක්ෂවරයා
(5) අභිවාහකයා, අභිනය, ප්‍රේක්ෂකයා (.........)

**3.** භරතමුනි නාට්‍ය කලාවේ විශේෂත්වය හඳුන්වා දෙන ශ්ලෝකයෙහි 'නාට්‍ය' යන නම දැරීමට සුදුසු ලක්ෂණ සඳහන් කොට ඇත. එම ලක්ෂණ අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) ප්‍රයෝගයක්, ක්‍රියාවක්, ශිල්පයක් හා ඥානයක් තිබිය යුතු ය.
(2) ඥානයක්, ශිල්පයක්, විද්‍යාවක්, කලාවක්, ප්‍රයෝගයක් හා ක්‍රියාවක් පැවැතිය යුතු ය.
(3) ස්මෘතියක්, අනුකරණයක්, ශිල්පයක් හා කෞශල්‍යයක් තිබිය යුතු ය.
(4) අනුකරණයක්, ප්‍රයෝගයක්, දුර දක්නා නුවණක් තිබිය යුතු ය.
(5) පළපුරුද්ද, ශිල්පීය හැකියාව, ඥානය හා ප්‍රයෝගය තිබිය යුතු ය. (.........)

**4.** අභිරූපණ ශිල්පියකුගේ කාර්යය සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?
(1) මම තෙලිතුඩ උපයෝගී කරගෙන මා අවට ඇති හිස් අවකාශය රූ රටාවෙන් අලංකාර කරමි.
(2) මම වේදිකාව මත ප්‍රතිමාවක් මෙන් සිටගෙන ගායනා කරමි.
(3) මම චතුර් අභිනය උපයෝගී කොටගෙන රූ රටා මවමි.
(4) මම, මා වටා ඇති අවකාශයේ අර්ථ විරහිත රූ රටා මවමින් සිටිමි.
(5) මම, මා අවට ඇති හිස් අවකාශයේ මාගේ ශාරීරික චලන උපයෝගී කර ගනිමින් අර්ථාන්විත රටා මවමි. (.........)

**5.** බැලේ නර්තනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පසුබිම් දර්ශනය සහ ගායනය ප්‍රමුඛ වේ.
(2) නර්තනයේ දී පා ඇඟිලි තුඩුවලින් සිට නර්තනයේ හා සිරුරේ සැහැල්ලු බව ප්‍රකට කෙරේ.
(3) නර්තනය, වේෂභූෂණය හා වාදනය ප්‍රමුඛ වේ.
(4) නර්තනයට ප්‍රමුඛත්වය හිමිවන අතර ආලෝකය හා පසුතල අවම කෙරේ.
(5) නර්තනය මාධ්‍යය කොටගෙන සංගීතය භාවිතයෙන් කථා ප්‍රවෘත්තියක් ඉදිරිපත් කෙරේ. (.........)

**6.** ඔපෙරා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගායකයනට වැදගත් ස්ථානයක් දෙන සම්ප්‍රදායකි.
(2) ඔපෙරා රඟහල් බෙහෙවින් සරල ඒවා විය.
(3) කථා වස්තුවක් අන්තර්ගත නොවිණි.
(4) එංගලන්තයේ ප්‍රභවය විය.
(5) ප්‍රාසංගික කලාවක් ලෙස හැඳින්විය නොහැකි ය. (.........)

[ දෙවැනි පිටුව බලන්න.

7. ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බටහිර රටවල ප්‍රචලිත බැලේ නාට්‍යයේ අනුකරණයකි.
(2) පසුබිම් සංගීතය හා ගායනය වැදගත් නො වේ.
(3) ප්‍රේමකුමාර එපිටවෙල, පනීභාරත, චිත්‍රසේන, වජිරා ආදීහු මුද්‍රා නාට්‍ය කලාවට දායකත්වය දැක්වූහ.
(4) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය වූයේ චිත්‍රසේන හා වජිරා අතින් පමණි.
(5) මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍ය යනුවෙන් ද හැඳින්වේ. (.........)

8. ගීත නාටක සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) 'කැලෑමල්' ප්‍රේමසිරි කේමදාසගේ ගීත නාටකයකි. (2) බටහිර ගීත නාටකවල ආභාසය ලබා ඇත.
(3) චතුර් අභිනය ප්‍රමුඛ වන කලාවකි. (4) ඩබ්.බී. මකුලොලුව ගීත නාටක නිර්මාණය කළේ නැත.
(5) බටහිර ඔපෙරාවේ ආභාසය ලබා ඇත. (.........)

9. නෘත්ත, නෘත්‍ය, නාට්‍ය වශයෙන් වන අර්ථ නිරූපණය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **වැරදි** පිළිතුර තෝරන්න.
(1) මෙම වචනය ප්‍රභවය වී ඇත්තේ 'නෘත්' හා 'නට්' ධාතුවලිනි.
(2) නෘත්ත යනු ශුද්ධ නැටුම හෙවත් රිද්මයානුකූල ගාත්‍ර වික්ෂේපයක් පමණක් නො වේ.
(3) ධනංජය ගේ දශරූපයෙහි මේ පිළිබඳ ව සඳහන් වේ.
(4) නෘත්‍යයෙන් කිසියම් වූ භාවයක් ප්‍රකට කෙරේ.
(5) නාට්‍යයේ ප්‍රමුඛත්වය හිමි වන්නේ රූපණයටයි. (.........)

10. ඇරිස්ටෝටල්ගේ ප්‍රකාශය අනුව නාට්‍ය යනු,
(1) උත්තුංග ක්‍රියාවක අනුකරණයකි. (2) අවස්ථා අනුකරණයකි.
(3) ජීවිතයේ පැතිකඩකි. (4) ජීවිතයේ පිටපතකි. සිරිත් විරිත්වල කැටපතකි.
(5) ලෝකයේ සුඛ-දුඃඛ යන දෙකෙන් ම යුක්ත වූ යම් ස්වභාවයක් පවතී ද, එය අංග ආදි අභිනයෙන් ප්‍රකාශ කිරීමයි. (.........)

11. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නාට්‍ය පෙළක අත්‍යවශ්‍යයෙන් ම අන්තර්ගත විය යුත්තේ කුමක් ද?
(1) නාට්‍ය පෙළක කථා වස්තුවක් තිබීම අනිවාර්ය ය. (2) රඟ දැක්වීම සඳහා ම රචනා කොට තිබිය යුතු ය.
(3) වක්‍රෝක්ති සහ ව්‍යංග්‍යාර්ථ ඇතුළත් විය යුතු ය. (4) සංවාද සහ රංග විධාන අන්තර්ගත විය යුතු ය.
(5) අංකවලට බෙදා තිබිය යුතු ය. (.........)

12. නාට්‍ය අධ්‍යක්ෂවරයකු සතු විය යුතු ගුණාංගවලට අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) සොඳුරු ආඥාදායකයකු ලෙස ක්‍රියා කරයි.
(2) නාට්‍යයට සම්බන්ධ සියලු දෙනා සමග ඉතා සහයෝගයෙන් ක්‍රියා කරමින් තම අදහස් පමණක් ක්‍රියාවට නැංවීමට වගබලා ගනියි.
(3) නළු නිළියන් සමග සුහද ව කටයුතු කරමින් ඔවුන්ගේ උපරිම ඵලදායිතාව ලබා ගනියි.
(4) නාට්‍යයට සම්බන්ධ සෙසු ශිල්පීන්ට ඇහුම්කන් දෙයි.
(5) නාට්‍ය නිෂ්පාදනය සම්බන්ධ මූලික වගකීම දරයි. (.........)

13. නූතනයේ බහුල ව දක්නට ලැබෙන ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව බිහිවූයේ,
(1) යුරෝපයේ මධ්‍යකාලීන යුගයේ දී ය. (2) එළිසබෙතීන යුගයේ දී ය. (3) පුනරුදය යුගයේ දී ය.
(4) රොමැන්ටික් යුගයේ දී ය. (5) නූතන යුගයේ දී ය. (.........)

14. නාට්‍යයක රංගාලෝකයෙන් මූලික වශයෙන් අපේක්ෂා කෙරෙනුයේ,
(1) රංගභූමි තාක්ෂණය උපරිම වශයෙන් ලබාගැනීම ය. (2) වේෂභූෂණ සහ අංග රචනා වර්ණවත් කිරීම ය.
(3) විවිධ අත්හදා බැලීම් ක්‍රියාත්මක කිරීම ය. (4) රංගාලෝක ශිල්පියකුගේ සේවය අත්‍යවශ්‍ය වීම ය.
(5) අඳුර පලවා හැර දෘශ්‍යතාව සාක්ෂාත් කිරීම ය. (.........)

15. නාට්‍යයක 'ප්‍රේක්ෂාව' සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ඇරිස්ටෝටල්ගේ අර්ථකථනය තෝරන්න.
(1) පසුතල නිර්මාණ හා අලෝකයයි. (2) රංගභූමිය මත මොහොතින් මොහොත මැවෙන දෙයයි.
(3) නාට්‍යෝපකරණ හා අංග රචනයයි. (4) ප්‍රේක්ෂාව යනු වේදිකාවේ මැවෙන දෘෂ්ටිගෝචර බවයි.
(5) වේෂභූෂණය හේතුවෙන් ප්‍රේක්ෂකයා අබිමුව මැවෙන දර්ශනයයි. (.........)

16. නාට්‍යයක රංගභූමි පාලක සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රංගභූමි පාලනයට අදාළ නිශ්චිත කාර්යභාරයක් නැත.
(2) නාට්‍යයට සම්බන්ධ සියලු දෙනා මෙහෙයවමින් නාට්‍ය දර්ශනය ආරම්භ කිරීම, පවත්වාගෙන යාම හා අධ්‍යක්ෂකට සහාය වීම ආදි කාර්යවල නිරත වන්නා ය.
(3) වේදිකා පාලනයේ දුර්වලතාව නාට්‍යයක අසාර්ථකත්වයට බලපෑම් නොකරයි.
(4) රංගභූමි පාලකයා හා වේදිකා පාලකයා එක ම භූමිකාවක නිරත නො වේ.
(5) රංගභූමිය සම්බන්ධ කටයුතුවලට පමණක් සහභාගි වුව ද නිෂ්පාදන කාර්යයට සහාය නො වේ. (.........)

17. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ප්‍රේක්ෂකයා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ප්‍රතිපෝෂණය නාට්‍යයකට අත්‍යවශ්‍ය වන බැවින් ප්‍රේක්ෂකයාගේ මැදිහත් වීම අනිවාර්ය වේ.
(2) නාට්‍යයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට තුඩුදෙන අනිවාර්ය සාධකයකි.
(3) නාට්‍යයක ප්‍රේක්ෂාව කෙරෙහි පමණක් අවධානය යොමු කරන්නා ය.
(4) ප්‍රේක්ෂකයා යනු විචාරකයකු, රසිකයකු හා විනිශ්චයකරුවෙක් ද වේ.
(5) ප්‍රේක්ෂකයා යනු හුදු රසිකයකු පමණි. (.........)

[ තුන්වැනි පිටුව බලන්න.

**18.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් රංගභූමි තාක්ෂණයට අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යමය වාතාවරණය ගොඩනැගීමට අවශ්‍ය ශබ්ද හා දෘශ්‍ය උපක්‍රම භාවිතය
(2) ප්‍රේක්ෂාව චමත්කාර කරවීමට අවශ්‍ය උපක්‍රම භාවිතය
(3) ආලෝකය, සංගීතය, රංගභූමි අලංකරණය ආදිය රංගභූමි තාක්ෂණයට යොදා ගැනීම
(4) රංගභූමි කළමනාකරණයට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම
(5) ශ්‍රව්‍ය, දෘශ්‍ය, සිනමාව ආදී නාට්‍යයට පරිබාහිර මාධ්‍යයන්ගේ සහයෝගය ලබාගැනීම (.........)

**19.** නාට්‍යෝපකරණ භාවිතය සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු කරුණු පහත දැක්වේ. ඒ අතුරෙන් **නුසුදුසු** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යෝපකරණ බොහෝවිට වේදිකා පසුතලය හා සම්බන්ධ කළ හැකි බව
(2) නාට්‍යය රඟ දැක්වෙන අතරතුර නාට්‍යෝපකරණ එහා මෙහා කිරීම නොකළ යුතු බව
(3) නාට්‍යෝපකරණ සරල, මිල අඩු, පරිහරණයට පහසු විය යුතු බව
(4) රංගනය හා චරිතය ඉස්මතු කිරීමට තුඩු දෙන බව
(5) නාට්‍යෝපකරණ නාට්‍යයකට අත්‍යවශ්‍ය නොවන බව (.........)

**20.** වේෂභූෂණය හා අංග රචනය සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නුසුදුසු** ප්‍රකාශය තෝරා දක්වන්න.
(1) වේෂභූෂණ නාට්‍යයේ ශෛලියට හා තේමාවට ගැළපිය යුතු ය.
(2) කාලය, යුගය, සංස්කෘතිය, සමාජ පසුබිම ගැන සැලකිලිමත් විය යුතු ය.
(3) වර්ණ සංයෝගය හා රංගාලෝකය ඊට සරිලන ලෙස යෙදිය යුතු ය.
(4) රූපණ කාර්යය පහසු කරවන අයුරින් හා නිර්මාණාත්මක ලෙස සැකසිය යුතු ය.
(5) සෑම විට ම අතිශයෝක්තියෙන් යුත් වේෂභූෂණයක් හා අංග රචනයක් භාවිත විය යුතු ය. (.........)

**21.** භරතමුනි නාට්‍යශාස්ත්‍රයේ සඳහන් කොට ඇති රස අටෙන් හතරක් අන්තර්ගත ව ඇති ගොනුව තෝරන්න.
(1) රති, හාස, ශාන්ත, ශෘංගාර (2) වීර, ජුගුප්සා, රෞද්‍ර, රති
(3) ශෝක, ශාන්ත, භයානක, ශෘංගාර (4) ශෘංගාර, රෞද්‍ර, කරුණ, වීර
(5) අද්භූත, රති, වීර, කරුණ (.........)

**22.** නව රූපණ විධි ක්‍රමයක් හඳුන්වා දෙමින් 'නළුවකුගේ පෙරහුරුව' (An Actor Prepares) නම් කෘතිය රචනා කළේ,
(1) බර්ටෝල් බ්‍රෙෂ්ට් ය. (2) ඔගස්ටෝ බොආල් ය. (3) සැමුවෙල් බෙකට් ය.
(4) අර්වින් පිස්කැටර් ය. (5) කොන්ස්ටාන්ටින් ස්ටැනිස්ලව්ස්කි ය. (.........)

**23.** ශෝකාත්ම/ට්‍රැජඩි නාට්‍යයක කථා වස්තුව ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදෙන බව ඇරිස්ටෝටල් පවසා ඇත. එම කොටස් දෙක වන්නේ,
(1) ප්‍රත්‍යාවර්තනය හා ප්‍රත්‍යාභිඥානයි. (2) සරල හා සංකීර්ණ කථා වස්තුවයි.
(3) අවශ්‍යතාවය හා සම්භාව්‍යතාවයි. (4) කාරුණ්‍යය හා භයයි.
(5) ආකුලීකරණය හා අනාවරණයයි. (.........)

**24.** ජපන් නෝ නාට්‍යයට අදාළ ෂිතෙ ත්සුරේ, වකි, කොකත යන නාම සඳහා සිංහලයෙන් භාවිත වන නාම අනුපිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) ළමා නළුවා, දෙවන නළුවා, ප්‍රධාන නළුවා (2) දෙවන නළුවා, ළමා නළුවා, දෙවන නළුවාගේ සහායක
(3) ප්‍රධාන නළුවා, දෙවන නළුවා, ළමා නළුවා (4) ප්‍රධාන නළුවා, ප්‍රධාන නළුවාගේ සහායක, දෙවන නළුවා
(5) ප්‍රධාන නළුවා ගේ සහායක, දෙවන නළුවා, ළමා නළුවා (.........)

**25.** සංස්කෘත නාට්‍යයක 'අර්ථප්‍රකෘති' ලෙස හැඳින්වෙන්නේ,
(1) බීජ, බින්දු, පතාකා, ප්‍රකරී හා කාර්යයයි. (2) ආරම්භ, ප්‍රයත්න, ප්‍රාප්ත්‍යාශා, නියතඵලප්‍රාප්ති හා ඵලාගමයි.
(3) ආරම්භ, යත්න, පතාකා, නියතාප්ති හා ඵලාගමයි. (4) ප්‍රවේශක, විෂ්කම්භක, චූලිකා, අංකාවතාර සහ අංකමුඛයි.
(5) භාෂණ විධි, අර්ථෝපක්ෂේප, කක්ෂ්‍යා විභාගය හා භරතවාක්‍යයයි. (.........)

● පහත දැක්වෙන පද ආශ්‍රයෙන් අංක **26** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - ඇන්ටන් චෙකොෆ් C - වකඔන්නගත E - ස්වප්නවාසවදත්ත
B - සකලජන D - ජෝ, හ, ක්යු

**26.** A අකුරෙන් දැක්වෙන්නේ,
(1) එපික් රංගය අනුගමනය කළ ශිල්පියෙකි. (2) චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකි.
(3) තත්විධි ක්‍රමය හඳුන්වා දුන් තැනැත්තා ය. (4) අසංගත නාට්‍ය රචකයෙකි.
(5) යථාර්ථවාදී රංග රීතිය අනුගමනය කළ නාට්‍යකරුවෙකි. (.........)

**27.** B අකුරෙන් දැක්වෙන්නේ,
(1) ග්‍රීක නාට්‍යයකි. (2) එළිසබෙතීන නාට්‍යයකි. (3) නාට්‍ය රචකයෙකි.
(4) ජපන් නාට්‍යයකි. (5) මධ්‍යකාලීන සදුපදේශ නාට්‍යයකි. (.........)

**28.** C අකුරෙන් දැක්වෙන්නේ,
(1) නෝ නාට්‍යයේ නළුවෙකි. (2) කබුකි වේදිකාවේ කොටසකි.
(3) කබුකි නාට්‍යයේ තරුණ ස්ත්‍රී චරිතයකි. (4) නෝ නාට්‍යයේ සහාය නළුවෙකි.
(5) කබුකි නාට්‍ය රචකයෙකි. (.........)

**29.** D අකුරෙන් දැක්වෙන්නේ,
(1) කබුකි නාට්‍යයේ ක්‍රියා විකාසයයි. (2) නෝ නාට්‍යයේ ප්‍රධාන සහ අප්‍රධාන නළුවායි.
(3) නෝ නාට්‍යයක නමයි. (4) කබුකි නාට්‍යයේ ප්‍රධාන අංග තුනයි.
(5) නෝ නාට්‍යයේ ආරම්භය, වර්ධනය හා අවසානයයි. (.........)

**30.** E අකුරෙන් දැක්වෙන්නේ,
(1) කාලිදාසගේ නාට්‍යයකි. (2) භාසගේ නාට්‍යයකි. (3) සංස්කෘත නාට්‍ය මූලාශ්‍රයකි.
(4) ශුද්‍රකගේ නාට්‍යයකි. (5) සංස්කෘත නාටිකාවකි. (.........)

● පහත දැක්වෙන පද ආශ්‍රයෙන් අංක **31** සිට **33** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - නේතෘ B - ලෝකධර්මී C - ඉතිවෘත්තය

**31.** A අකුරෙන් දැක්වෙන්නේ,
(1) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ වීරයා ය. (2) සංස්කෘත නාට්‍යයේ සෘෂිවරුන් හඳුන්වන නාමයයි.
(3) නාට්‍යය මෙහෙයවන්නා ය. (4) සංස්කෘත නාට්‍යයේ කථා නායකයා ය.
(5) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ අනාගත වක්තෘවරයා ය. (.........)

**32.** B අකුරෙන් දැක්වෙන්නේ,
(1) අභිනය ස්වාභාවික ලෙස නොදක්වන සම්ප්‍රදායයි. (2) නාට්‍යශාස්ත්‍රයේ දැක්වෙන ප්‍රධාන නාට්‍ය ප්‍රභේද දෙකින් එකකි.
(3) අංගචලනය ලාලිත්‍යයෙන් යුතුව දක්වන සම්ප්‍රදායයි.(4) ලෝකයාගේ පැවැත්ම විකෘති ආකාරයෙන් ඉදිරිපත් කිරීමයි.
(5) පසුතල හා රංගෝපකරණ භාවිත නොවේ ය'යන්නයි. (.........)

**33.** C අකුරෙන් දැක්වෙන්නේ,
(1) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ ආරම්භක අවස්ථාවයි. (2) සූත්‍රධාර ප්‍රේක්ෂකයා ඉදිරියේ හඬනගා ගයන ශ්ලෝකයයි.
(3) පූර්වරංගය යන අර්ථය දනවන පදයයි. (4) සංස්කෘත නාට්‍යයක වස්තුව හඳුන්වන තවත් නාමයකි.
(5) ලෝක ස්වභාවය අනුකරණය කිරීම යන අර්ථය දෙයි. (.........)

● පහත සඳහන් නාට්‍යවල එන විවිධ චරිතවලට අයත් භූමිකා අන්තර්ගත නිවැරදි වරණය තෝරා අංක **34** සිට **37** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - සිංහබාහු නාට්‍යයේ සුප්පා දේවි
B - ජුලියස් සීසර් නාට්‍යයේ සීසර්
C - ඊඩිපස් නාට්‍යයේ ඊඩිපස් රජ
D - අභිඥානශාකුන්තලයේ ශකුන්තලා
E - සෙල්ලම් ගෙය නාට්‍යයේ නෝරා

**34.** A අකුරෙන් දැක්වෙන්නේ,
(1) මවක, රජ බිසවක හා බිරිඳක් ය. (2) රජ කුමරියක, බිරිඳක හා මවක් ය.
(3) මිනිස් කතක, රජකුමරියක හා මවක් ය. (4) කාන්තාවක, බිරිඳක හා මවක් ය.
(5) මවක, බිරිඳක හා සහෝදරියක් ය. (.........)

**35.** B අකුරෙන් දැක්වෙන්නේ,
(1) රජකු, මිතුරකු හා ස්වාමිපුරුෂයෙකි. (2) ඒකාධිපතියකු, පාලකයකු හා ස්වාමිපුරුෂයෙකි.
(3) පියකු, රජකු හා පාලකයෙකි. (4) ඒකාධිපති පාලකයකු, ස්වාමිපුරුෂයකු හා මිතුරෙකි.
(5) සටන්කාමියකු, සතුරකු හා සෙනෙට් සභිකයෙකි. (.........)

**36.** C අකුරෙන් දැක්වෙන්නේ,
(1) රජකු, පියකු, පුතකු හා ස්වාමිපුරුෂයෙක් ය. (2) රජකු, ස්වාමිපුරුෂයකු, ආගන්තුකයකු හා සතුරෙක් ය.
(3) පියකු, සහෝදරයකු, මිතුරකු හා තීබ වැසියෙක් ය.(4) පියකු, ස්වාමිපුරුෂයකු, පීතෘඝාතකයකු හා සතුරෙක් ය.
(5) පුතකු, සහෝදරයකු, ඥාතියකු හා කොරින්තියානුවෙක් ය. (.........)

**37.** D අකුරෙන් දැක්වෙන්නේ,
(1) පෙම්වතියක, දියණිකෙනකු, අප්සරාවක හා මවක් ය.(2) පෙම්වතියක, බිරිඳක, මිතුරියක හා දියණිකෙනෙක් ය.
(3) ගැබිණියක, මවක, දියණිකෙනකු හා අප්සරාවක් ය.(4) තරුණියක, රූමතියක, මිතුරියක හා දියණිකෙනෙක් ය.
(5) අප්සරාවක, දියණිකෙනකු, යෙහෙළියකු හා කුලකතක් ය. (.........)

**38.** E අකුරෙන් දැක්වෙන්නේ,
(1) දියණිකෙනකු, මිතුරියක හා තරුණියක් ය. (2) මිතුරියක, පෙම්වතියක හා මවක් ය.
(3) මවක, බිරිඳක හා මිතුරියක් ය. (4) නාස්තිකාරියක, මිතුරියක හා බිරිඳක් ය.
(5) හිතුවක්කාරියක, නර්තකියක හා මවක් ය. (.........)

**39.** ක්ෂණික නිරූපණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ක්ෂණික නිරූපණයට නියමිත මාතෘකාවක් තිබිය යුතු ය.
(2) ක්ෂණික නිරූපණයට කලින් සකසා ගත් පිටපතක් තිබිය යුතු ය.
(3) තෝරා ගන්නා මාතෘකාව නාට්‍යමය ගුණයෙන් යුතු විය යුතු ය.
(4) ලැබී ඇති කාලය හා අවකාශය උචිත ලෙස භාවිත කළ යුතු ය.
(5) පරිකල්පන ශක්තිය හා සහජ දක්ෂතාව වැදගත් වේ. (.........)

**40.** නාට්‍යයක 'ගැටුම' අවශ්‍ය වන්නේ මන්දැයි සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් ප්‍රබල ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යයේ වර්ධනය වෙනස් වීම (2) හේතුඵල සම්බන්ධය හා විශ්වසනීයත්වය රැකීම
(3) කුතුහලය සහ ආතතිය රඳවා ගැනීම (4) ගැටුම අපූර්වත්වය ගෙන ඒමට සමත් වීම
(5) ගැටුම මගින් අනාවරණය වන හරයන් සමාජයට වැදගත් වීම (.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

**උපදෙස්:**

✳ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) නාට්‍ය හා රංග කලාවේ මූලිකාංග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)
(ii) ඉහත මූලිකාංග **දෙකක්** ගැන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) නාට්‍ය කලාව සෙසු ප්‍රාසංගික කලා අතර ප්‍රමුඛ වීමට හේතුවන මූලිකාංග ගැන සාකච්ඡාවක් කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) පෙරදිග හා අපරදිග රටවල භාවිත වන රංගභූමි වර්ග **දෙක** බැගින් හඳුන්වාදෙන්න. (ලකුණු 04 යි.)
(ii) ඔබ හඳුන්වාදුන් රංගභූමි අතුරෙන් පෙරදිග හා අපරදිග රංගභූමි එක බැගින් තෝරා එහි අන්තර්ගත කොටස් ගැන විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) ඉහත එක් රංගභූමියක ලක්ෂණ එම නාට්‍ය ශෛලිය අනුව සැකසී ඇති අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) චතුර් අභිනය හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි.)
(ii) 'අභිනය'අයත් වන්නේ නාට්‍ය පිටපතට ද? නොඑසේ නම් නිෂ්පාදනයට ද? පිළිතුර සහේතුක ව විග්‍රහ කරන්න. (ලකුණු 05 යි.)
(iii) 'ආහාර්ය අභිනයට' අයත් අංග පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 06 යි.)

## B කොටස

**4.** (i) සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ භාෂණ විධි **හතරක්** හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි.)
(ii) ඉහත **4** (i) හි භාෂණ විධි **දෙකක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
(iii) සංස්කෘත නාට්‍යයේ භාෂණ විධිවල දක්නට ලැබෙන ලෝකධර්මී හා නාට්‍යධර්මී ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) නාට්‍ය විචාරය යනු කුමක් දැ යි පහදන්න. (ලකුණු 04 යි.)
(ii) නාට්‍ය විචාරයේ දී සැලකිල්ලට ලක් කළ යුතු කරුණු මොනවා ද? (ලකුණු 05 යි.)
(iii) නාට්‍ය විචාරය නාට්‍ය කලාවේ උන්නතියට හේතු වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) රූපණය පිළිබඳ සිද්ධාන්ත ඉදිරිපත් කළ බටහිර නාට්‍යවේදීන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 04 යි.)
(ii) ඉහත **6** (i) හි එක් අයකුගේ රූපණ සිද්ධාන්තය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) එම සිද්ධාන්තය අනුව නිෂ්පාදනය වූ බටහිර නාට්‍යයක් පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 06 යි.)

✳ ✳ ✳

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ……………………………

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

※ **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

※ එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

**1.** නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජාකර්ම තුනක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සූවිසි විවරණය, ගුරුගේ මාලාව, හේවිසි
(2) ආලවක දමනය, සූවිසි විවරණය, ගුරුගේ මාලාව
(3) මිලින්ද ප්‍රශ්නය, දොරකඩ අස්න, යුගාසන බණ
(4) දොරකඩ අස්න, යුගාසන බණ, පත්තිනි පද
(5) ආසන දෙකේ බණ, මිලින්ද ප්‍රශ්නය, කඩවත් තරණය (………)

**2.** කොහොඹායක්කංකාරියේ ඇතුළත් නාට්‍යමය පෙළපාළි තුනක් අන්තර්ගත වරණය කුමක් ද?
(1) දර්පණ යක්කම, ගබඩා කොල්ලය, නයා යක්කම
(2) සීතා යක්කම, අස්නෙ, මුවමල විදීම
(3) දිවිදානය, යක්ඇන්නුම, නයා යක්කම
(4) වැදි යක්කම, අත්‍යා බෙර වාදනය, අයිලෙ යැදීම
(5) ඌරා යක්කම, හැන්දෑ දූරය, මාරාව (………)

**3.** සන්නියකුම් යාගයේ රංගභූමි අලංකරණ තුනක් වන්නේ,
(1) දෙකොණ විලක්කුව, සූනියම් වීදිය සහ ඊගස ය.
(2) පිල්ලු වීදිය, ඊගස හා අටමගල වීදිය ය.
(3) මල්බලි, පිල්ලු වීදිය හා දෙකොණ විලක්කුව ය.
(4) සන්නියකුම් වීදිය, මල් යහන හා කපාල කුඩුව ය.
(5) අටමගල වීදිය, සන්නියකුම් වීදිය හා නවමාලේ මල් බලිය ය. (………)

**4.** රිද්දි යාගය හෙවත් රටයකුම යාගයේ නාට්‍යමය අවස්ථා තුනක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) දරු නැළවිල්ල, හැන්දෑ සමයම, ඌරා යක්කම
(2) මරා ඉපැද්දීම, අඹ විදමන, කපුයක්කාරිය
(3) නයා යක්කම, නානුමුරය, පන්දම් නැටීම
(4) දොළහ පෙළපාළිය, දරු නැළවිල්ල, ලිච්ඡවි නැටීම
(5) නානුමුරය, කපුයක්කාරිය, දරු නැළවිල්ල (………)

**5.** ගම්මඩු ශාන්තිකර්මයට අදාළ අංග වන්නේ,
(1) ඇත් බන්ධනය, කුමාර පෙළපාළිය හා මල නැටීම ය.
(2) අඹ විදමන, යක් ඇන්නුම හා මරා ඉපැද්දීම ය.
(3) දොළහ පෙළපාළිය, ඇත් බන්ධනය හා යක් ඇන්නුම ය.
(4) රාමා මැරීම, අඹ විදමන හා මරා ඉපැද්දීම ය.
(5) මී බන්ධනය, ඇත් බන්ධනය හා දුනු මාලප්පුව ය. (………)

**6.** පහත සඳහන් ප්‍රකාශවලින් සොකරි නාට්‍යයේ ශාන්තිකර්ම ලක්ෂණ හා සම්බන්ධ **වැරදි** වරණය තෝරන්න.
(1) නාට්‍යධර්මී ශෛලිය, අනුරූපණය, පුරුෂයන් පමණක් රඟපෑම, සරල වෙස්මුහුණු භාවිතය
(2) පූජ්‍යාර්ථය අන්තර්ගත ගායනා, ජේවීම, කථාවක් තිබීම, ගැටබෙරය භාවිත වීම
(3) අසභ්‍ය වචන භාවිතය, ගායනා අන්තර්ගත වීම, අනුරූපණය, චරිත කිහිපයක් තිබීම
(4) යක්කම් හා පාළි අන්තර්ගත වීම, යක් බෙරය භාවිතය, වෙස් මුහුණු භාවිතය, වේදිකාවක රඟ දැක්වීම
(5) ජේවීමේ චාරිත්‍ර අනුගමනය, පහන් පැලක් තිබීම, යක්කම් හා පාළිවලින් උපුටාගත් අවස්ථා තිබීම, පුරුෂයන් පමණක් රඟපෑම (………)

**7.** සිංහල නාඩගම් පිළිබඳව **වැරදි** ප්‍රකාශය වන්නේ,
(1) පසුබිම් තිරයක් නොවීම, නිශ්චිත පෙළක් නොතිබීම හා වෙස්මුහුණු භාවිත වීම ය.
(2) කරළිය නම් ස්ථානයේ රඟදැක්වීම, නිශ්චිත පෙළක් තිබීම හා පසුබිම් තිරයක් භාවිත වීම ය.
(3) නාට්‍යධර්මී ශෛලිය අනුගමනය, පුරුෂයන් පමණක් රඟපෑම හා ස්ථාවර පාත්‍රයන් සිටීම ය.
(4) කර්ණාටක සංගීතය භාවිතය, නිශ්චිත පෙළක් තිබීම හා ගායක පිරිසක් සිටීම ය.
(5) පොතේගුරු සිටීම, පූර්ව රංගයක් තිබීම හා රාත්‍රියේ රඟ දැක්වීම ය. (………)

[ දෙවැනි පිටුව බලන්න.

**8.** කෝලම් නාටකයේ රංග ශෛලිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නිශ්චිත රංග ආකෘතියක් නැතිවීම, කුලභේදය පදනම් නොවීම, ස්ථාවර පාත්‍රයන් නොසිටීම
(2) නාට්‍යධර්මී ශෛලිය යොදා ගැනීම, නිශ්චිත ආකෘතියක් පැවතීම, පූර්ව රංගයක් තිබීම
(3) ගායක පිරිසක් සිටීම, ස්ත්‍රීන් රඟපෑම, වෙස්මුහුණු භාවිත නොවීම
(4) සමාජ පසුබිම නොසැලකීම, හාස්‍යයට තැනක් නොදීම, නැටුම් අන්තර්ගත නොවීම
(5) නාට්‍යධර්මී ශෛලියට අනුගත නොවීම, නිශ්චිත ආකෘතියක් නොතිබීම, පූර්ව රංගයක් නොතිබීම (………)

● පහත දැක්වෙන මාතෘකා ආශ්‍රයෙන් අංක **9** සිට **12** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - කපටි ආරක්ෂකයා D - පාර්සි නාට්‍ය කණ්ඩායම G - රොඩී කෙල්ල
B - පමුණුගම E - සිරිසේන විමලවීර H - කඩවුණු පොරොන්දුව
C - චාල්ස් ඩයස් අමරතුංග F - අවසාන රාත්‍රිභෝජනය

**9.** පාස්කු නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A හා B ය. (2) B හා F ය. (3) F හා C ය. (4) G හා E ය. (5) G හා F ය.(………)

**10.** ටීටර් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A හා G ය. (2) C හා G ය. (3) E හා A ය. (4) E හා G ය. (5) F හා C ය.(………)

**11.** මිනර්වා නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A හා F ය. (2) A හා H ය. (3) B හා E ය. (4) E හා G ය. (5) F හා H ය.(………)

**12.** නූර්ති හා සම්බන්ධ වන්නේ,
(1) C හා D ය. (2) C හා G ය. (3) C හා H ය. (4) E හා D ය. (5) F හා H ය. (………)

**13.** මහාචාර්ය ඊ.එෆ්.සී. ලුඩොවයික් දායකත්වය දැක්වූ නාට්‍ය සංගමය වන්නේ,
(1) ශේක්ස්පියර් සමාජය ය. (2) විශ්වවිද්‍යාලය කොලීජියේ නාට්‍ය සංගමය ය.
(3) ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල සමිතිය ය. (4) සිලෝන් ඩ්‍රාමා ලීග් ය.
(5) ද ප්ලේයර්ස් සංගමය ය. (………)

**14.** 'රකිනු ඊශ්වරා' ගීතය අන්තර්ගත ව ඇත්තේ කවර නූර්තියේ ද?
(1) දුටුගැමුණු (2) ශ්‍රී වික්‍රම (3) සිරිසඟබෝ (4) රාමායණය (5) පද්මාවතී (………)

**15.** 'ද්‍රෝහියා' නම් ප්‍රබල දේශපාලන නාට්‍යය නිෂ්පාදනය කළේ කවරෙක් ද?
(1) එස්. මෞනගුරු (2) කේ. කනපතිපිල්ලේ (3) එම්. ෂන්මුගලිංගම්
(4) එස්. විද්‍යානන්දන් (5) චෞර්ණලිංගම් (………)

● පහත දැක්වෙන මාතෘකා ආශ්‍රයෙන් අංක **16** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - වඩමෝඩි D - රතී දෙවඟන G - විජයතසම්
B - මාරි අම්මා E - අනංග දෙවියා H - නවරාත්‍රි මංගල්‍යය
C - කාත්තන් F - තෙන්මෝඩි


**16.** උතුරු හා දකුණු ශෛලි වශයෙන් හැඳින්වෙන්නේ,
(1) A හා C ය. (2) A හා F ය. (3) B හා D ය. (4) E හා F ය. (5) F හා C ය. (………)

**17.** කාත්තවරායන්කූත්තු හා සම්බන්ධ වන්නේ,
(1) B හා C ය. (2) B හා F ය. (3) C හා D ය. (4) C හා E ය. (5) E හා F ය. (………)

**18.** කාමන්කූත්තු හා සම්බන්ධ වන්නේ,
(1) B හා D ය. (2) B හා E ය. (3) C හා F ය. (4) D හා E ය. (5) D හා F ය.(………)

**19.** හින්දු ආගමික උත්සවයක් හා සම්බන්ධ වන්නේ,
(1) B හා H ය. (2) C හා E ය. (3) E හා H ය. (4) G හා H ය. (5) F හා G ය.(………)


● දකුණු පස දැක්වෙන්නේ නෝ රඟහලකි. එය ආශ්‍රය කොටගෙන අංක **20** සහ **21** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**20.** B අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(1) කගමි ඉත (2) ප්‍රධාන වේදිකාව
(3) නි-නො-මත්සු (4) හෂිගකරි
(5) අගෙමකු (………)

**21.** D අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(1) චකි බසිර (2) ෂිතෙ බසිර
(3) හෂිගකරි (4) අගෙමකු
(5) කගමි ඉත (………)

● කබුකි රඟහලක රූපසටහනක් දකුණු පස දැක්වේ. රූපසටහන ඇසුරෙන් අංක **22** සහ **23** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**22.** අංක ❸න් දැක්වෙන්නේ කුමක් ද?
(1) හනමිචිය (2) සෙරිදෙෂි
(3) සෙරිඅගෙ (4) බුතයි
(5) මවරිබුතයි (.........)

**23.** 'කකිවරි' හැඳින්වෙන්නේ කුමන අංකයෙන් ද?
(1) අංක ❶ ය. (2) අංක ❷ ය.
(3) අංක ❸ ය. (4) අංක ❹ ය.
(5) අංක ❺ ය. (.........)

● පහත දැක්වෙන්නේ විවිධ රංගභූමි කොටස් අන්තර්ගත ලේඛනයකි. ඒ ආශ්‍රයෙන් අංක **24** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පැරොඩොසය E - අභ්‍යන්තර වේදිකාව
B - මත්තවාරණී F - ඕර්කීස්ට්‍රා
C - උපරි වේදිකාව G - නිරය
D - ස්වර්ගය H - රංග ශීර්ෂය

**24.** එලිසබෙතීන වේදිකාව හා සම්බන්ධ වන්නේ,
(1) C හා E ය. (2) C හා G ය. (3) E හා D ය. (4) E හා G ය. (5) G හා H ය. (.........)

**25.** ග්‍රීක වේදිකාව හා සම්බන්ධ වන්නේ,
(1) A හා D ය. (2) A හා F ය. (3) C හා H ය. (4) E හා F ය. (5) G හා F ය. (.........)

**26.** යුරෝපයේ මධ්‍යකාලීන වේදිකාව හා සම්බන්ධ වන්නේ,
(1) C හා E ය. (2) C හා H ය. (3) D හා G ය. (4) E හා H ය. (5) F හා H ය. (.........)

**27.** සංස්කෘත නාට්‍යය හා සම්බන්ධ වන්නේ,
(1) B හා C ය. (2) B හා F ය. (3) B හා H ය. (4) D හා G ය. (5) E හා H ය. (.........)

**28.** එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය තෝරන්න.
(1) කදාවළලු, රත්නාවලී, කුවේණී
(2) මනමේ, ලෝමහංස, ගුරුතරුව
(3) සිංහබාහු, හස්තිකාන්ත මන්තරේ, රන්කඳ
(4) රත්තරන්, පබාවතී, මහාසාර
(5) සිංහබාහු, රත්නාවලී, රන්කඳ (.........)

**29.** සුගතපාල ද සිල්වාගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය තෝරන්න.
(1) හෙලේ නැග්ග ඩෝං පුතා, හිතහොඳ අම්මණ්ඩි, හුණුවටය
(2) වෙස්මුහුණු, බෝඩිංකාරයෝ, කුවේණී
(3) දූන්න දූනුගමුවේ, බෝඩිංකාරයෝ, තුරංග සන්නිය
(4) මරාසාද්, අත්, ගොඩෝ එනකං
(5) මරාසාද්, ගුරුතරුව, තුරංග සන්නිය (.........)

**30.** දයානන්ද ගුණවර්ධනගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය තෝරන්න.
(1) ගජමන් පුවත, නරිබෑණා සහ පුත්‍ර සමාගම ය.
(2) මධුර ජවනිකා, ගජමන් පුවත සහ ආනන්ද ජවනිකා ය.
(3) හොටබරි යුද්දේ, මධුර ජවනිකා සහ දිරිය මව සහ ඇගේ දරුවෝ ය.
(4) බක්මහ අකුණු, පද්මාවතී සහ මෝදර මෝල ය.
(5) නරිබෑණා, මධුර ජවනිකා සහ වෙස් මුහුණු ය. (.........)

**31.** සයිමන් නවගත්තේගමගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය තෝරන්න.
(1) පුස්ලෝඩං, ගංගාවක් සපත්තු කබලක් සහ මරණයක්, ගගන සරන කුරුල්ලෝ
(2) සුදු සහ කළු හෙවත් වර්ණ, පුස්ලෝඩං, යෙර්මා
(3) සුබ සහ යස, පුස්ලෝඩං, මනරංජන වැඩවර්ජන
(4) ගගන සරන කුරුල්ලෝ, සුබ සහ යස, හෙලේ නැග්ග ඩෝං පුතා
(5) පුස්ලෝඩං, ගගන සරන කුරුල්ලෝ, අත් (.........)

**32.** හෙන්රි ජයසේනගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය කුමක් ද?
(1) අපට පුතේ මගක් නැතේ, යෙර්මා, හුණුවටය
(2) දිරිය මව සහ ඇගේ දරුවෝ, මනරංජන වැඩ වර්ජන, මකරා
(3) මකරා, ජනේලය, පුස්ලෝඩං
(4) ජනේලය, කපුවා කපෝති, කුවේණි
(5) මනරංජන වැඩ වර්ජන, හුණුවටය, වෙස්මුහුණු (………)

**33.** දූර්වාසස් ඍෂිවරයාගේ ශාපය අන්තර්ගත ව ඇත්තේ අභිඥානශාකුන්තලයේ කිනම් අංකයේ ද?
(1) සයවන (2) පස්වන (3) සිව්වන (4) තුන්වන (5) පළමුවන (………)

**34.** 'රැකඩ ගෙදර' නාට්‍යයේ ප්‍රධාන නාට්‍යෝපකරණ ඇතුළත් වරණය තෝරන්න.
(1) කලු කාඩ්පත්, සෙල්ලම් ඇඳුම, උඳුන, පියානෝව
(2) පුටුව, නත්තල් ගස, උඳුන, පියානෝව
(3) නත්තල් ගස, පියානෝව, ගිනි උඳුන, පුටුව
(4) උඳුන, තැම්බුරිනය, පුටුව, තරන්තලා
(5) ලිපිය, පියානෝව, ලියුම් පෙට්ටිය, නත්තල් ගස (………)

**35.** ජුලියස් සීසර් නාට්‍යයේ කථා ප්‍රවෘත්තියට පසුබිම්වන ස්ථානය කුමක් ද?
(1) එංගලන්තයේ ලන්ඩන් නගරය (2) රෝමයේ කැපිටෝල් මන්දිරය
(3) රෝමයේ වීදියක් (4) රෝම පුරවරයේ විවිධ ස්ථාන
(5) රෝමයේ විපණිපල (………)


**36.** හස්තිකාන්ත මන්තරේ නාට්‍යයට පදනම් වූ කථාව අන්තර්ගත ලාංකේය මූලාශ්‍රය වන්නේ,
(1) බෘහත්කථා සහ ප්‍රතිඥායෞගන්ධරායණයයි.
(2) ප්‍රතිඥායෞගන්ධරායණය සහ පාලි ධම්මපදට්ඨ කථාවයි.
(3) මහාවංසය හා සද්ධර්මරත්නාවලියයි.
(4) පාලිධම්මපදට්ඨ කථාව සහ සද්ධර්මරත්නාවලියයි.
(5) සද්ධර්මරත්නාවලිය සහ ජාතක පොතයි. (………)

**37.** ඇන්ටිගනී නාට්‍යයේ වයෝවෘද්ධ ගායන වෘන්දය පෙනී සිටින්නේ කුමන නගරයක පුරවැසියන් ලෙස ද?
(1) ග්‍රීසියේ ආර්ගෝස් නගරය (2) ග්‍රීසියේ කොරින්ති නගරය
(3) ට්‍රෝයි නගරය (4) ග්‍රීසියේ අවුලිස් නගරය
(5) ග්‍රීසියේ තීබ නගරය (………)

**38.** සුබ සහ යස නාට්‍යයේ යසලාලක තිස්ස රජුගේ දුර්වලකම් අන්තර්ගත වරණය තෝරන්න.
(1) හාස්‍යයට ප්‍රිය කිරීම, චන්දි භට්ටයන් නොරිස්සීම, අලස බව
(2) සුබ කෙරෙහි ඇඩි මිත්‍රත්වයක් දැක්වීම, රාජ්‍ය පාලනයට නොරිසිවීම, නිතර කෝපයට පත්වීම
(3) සැකයෙන් කටයුතු කිරීම, හාස්‍යය ප්‍රිය කිරීම, අවංකභාවය
(4) මධුපානයට ලොල්වීම, රාජ්‍යත්වය නොගැළපෙන චර්යා, ශූන්‍යත්වයෙන් ජීවිතය දෙස බැලීම
(5) සම්මතය හෙළා දැකීම, නිතර කෝපවීම, අවංකභාවය (………)

**39.** ශෝකජනක නාට්‍ය අන්තර්ගත වරණය තෝරන්න.
(1) ඇන්ටිගනී, ජුලියස් සීසර්, රැකඩ ගෙදර, සුබ සහ යස
(2) අභිඥානශාකුන්තලය, ජුලියස් සීසර්, රැකඩ ගෙදර, සුබ සහ යස
(3) ඇන්ටිගනී, ජුලියස් සීසර්, රැකඩ ගෙදර, හස්තිකාන්ත මන්තරේ
(4) අභිඥානශාකුන්තලය, ජුලියස් සීසර්, හස්තිකාන්ත මන්තරේ, සුබ සහ යස
(5) ඇන්ටිගනී, අභිඥානශාකුන්තලය, ජුලියස් සීසර්, රැකඩ ගෙදර (………)

**40.** දකුණුපස රූපයේ වේදිකාව අයත් වන්නේ කවර නාට්‍ය සම්ප්‍රදායකට ද?



(1) ග්‍රීක
(2) සංස්කෘත
(3) මධ්‍යකාලීන යුරෝපා
(4) කබුකි
(5) නෝ (………)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

**නාට්‍ය හා රංග කලාව - සිංහල II**
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

**57 S II**

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

**1.** (i) ශ්‍රී ලාංකේය ශාන්තිකර්මවලින් පූජාවට පාත්‍රවන ප්‍රධාන දේව හා යක්ෂ සංකල්ප **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි.)

(ii) ඔබ නම් කළ ශාන්තිකර්ම අතුරෙන් දේව හා යක්ෂ කොට්ඨාස වෙනුවෙන් පවත්වන ශාන්තිකර්ම එක බැගින් තෝරාගෙන, ඒවායෙහි අරමුණු, පූජා විධි හා අලංකරණ ගැන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ප්‍රචලිත සිංහල නාට්‍ය කිහිපයක දැක්වෙන ශාන්තිකර්මවල ආභාසය සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) සුබ සහ යස නාට්‍යයේ නායක හා ප්‍රතිනායක චරිත **දෙක** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04 යි.)

(ii) ප්‍රතිනායකයාගේ ක්‍රියාකාරකම් නාට්‍ය විකාසයට දක්වන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

(iii) යසලාලකතිස්ස රජු, 'ජීවිතය අර්ථ ශූන්‍ය බව' පවසන්නේ මන් ද? ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06 යි.)

**3.** (i) 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යයේ රංග රීතිය හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි.)

(ii) එය එම නාට්‍යයෙන් ප්‍රකට වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) චණ්ඩපජ්ජෝත රජුගේ උපාය පිළිබඳ ඔබ දරන ආකල්පය කුමක් ද? (ලකුණු 06 යි.)

### B - විදේශීය නාට්‍ය කලාව

**4.** (i) 'අභිඥානශාකුන්තලයේ' ශකුන්තලාගේ චරිතයේ කැපීපෙනෙන ලක්ෂණ **හතරක්** හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි.)

(ii) ශකුන්තලා මුහුණපාන අභාග්‍ය සම්පන්න අවස්ථාව පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඇන්ටිගනී නාට්‍යයේ ඇන්ටිගනී මුහුණපාන ඛේදජනක අවස්ථාව සමග ඉහත **4** (ii) හි අවස්ථාව සංසන්දනය කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) 'රූකඩ ගෙදර' නාට්‍යයේ ගැටුමට තුඩු දෙන ටෝවල්ඩ් හෙල්මර්ගේ චරිත ලක්ෂණ **හතරක්** පෙන්වා දෙන්න. (ලකුණු 04 යි.)

(ii) කුටුම්බයක යහ පැවැත්මට ඉහත **5** (i) හි චරිත ලක්ෂණවලින් කවරාකාර බලපෑමක් ඇති වේ දැයි රූකඩ ගෙදර ආශ්‍රයෙන් පෙන්වාදෙන්න. (ලකුණු 05 යි.)

(iii) 'රූකඩ ගෙදර' නාට්‍යයේ නිරූපිත කුටුම්බය බිඳ වැටීමට තුඩුදුන් මූලික කරුණු සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) ඔතෙලෝ/ජූලියස් සීසර් නිදසුන් ලෙස ගෙන ඛේදනීය වීරයාගේ ඉරණම කෙරෙහි බලපෑ හේතු සාධක **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත **6** (i) හි හේතු **දෙකක්** පිළිබඳ සාකච්ඡාවක් ගොඩනගන්න. (ලකුණු 05 යි.)

(iii) ඔතෙලෝ/ජූලියස් සීසර් යන එම නාට්‍ය දෙකෙහි ඛේදනීය වීරයාගේ දුර්භාග්‍යයට හේතු වූ බාහිර සාධක පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 06 යි.)

※ ※ ※